පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

කළමනාකරණය හා සංවර්ධනය පිලිබඳ ඩිප්ලෝමාව
පළමු සමාසිකාන්ත පරීක්ෂණය - 2021
**DM 012 – සංවර්ධන ගැටළු සහ අභියෝග**

උපදෙස් : කාලය : පැය 03 යි
මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හතක් (07) අඩංගු වේ.
ප්‍රශ්න හතරකට ( 04 ) පමණක් පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු අසුවක් ( 80 ) ලැබේ.

---

1. i. සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයකට දිගුකාලීනව ආර්ථික වර්ධන වේගය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 06)

ii. "ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථික වර්ධනය අවශ්‍ය වුවද, ආර්ථික සංවර්ධනය ලඟාකර ගැනීම සඳහා තවත් කොන්දේසි ඉටුවිය යුතු වේ" අදහස් දක්වන්න.

(ලකුණු 08)

iii. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? ආර්ථිකයක සංවර්ධන මට්ටටම මැනීමේදී මූර්ත දළ දේශිය නිෂ්පාදිතයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

2. i. පහත වගන්තිය ගැන විවේචනාත්මකව ප්‍රතිචාර දක්වන්න.

"නිදහස ලැබීමෙන් පසුව ආර්ථික වර්ධනයට සාපේක්ෂකව ශ්‍රී ලංකාව සාර්ථක ලෙස ඉහල මානව සංවර්ධන මට්ටමක් ලඟාකර ගෙන තිබේ"

(ලකුණු 12)

ii. රටක ඵලදායීතාව තීරණය කරන ප්‍රධාන සාධක කෙටියෙන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

3. i. රටක කාර්යක්ෂමතාව ඉහළ නංවන හා තීරණය කරන සාධක විස්තර කරන්න. (ලකුණු 06)

ii. නවෝත්පාදන සංකල්පය නිර්වචනය කරන්න. ආර්ථික සංවර්ධනය සඳහා වැදගත්වන මූලික නවෝත්පාදන වර්ග විස්තර කරන්න. ඔබේ පිළිතුර පැහැදිළි කිරීමේදී සුදුසු උදාහරණ භාවිත කරන්න. (ලකුණු 10)

iii. තිරසාර සංවර්ධනය නිර්වචනය කරන්න. (ලකුණු 04)

4. i. "දිගුකාලීන ලෝක සාමයක් ලඟාකර ගැනීම සඳහා පවතින ප්‍රධානම අභියෝගය දුප්පත්කමයි" අදහස් දක්වන්න. (ලකුණු 10)

ii. සංවර්ධනය වෙමින් පවතින රටවලට පොදු වූ ලක්ෂණ අඩුම වශයෙන් 5ක් දක්වා ඒවා විස්තර කරන්න. (ලකුණු 10)

5. i. "ශ්‍රී ලංකාවේ 'උගත් සේවා වියුක්ත්තිය' මගින් පෙන්නුම් කරන්නේ පවතින රැකියා අවශ්‍යතාවේ හා අධ්‍යාපනයේ කිසියම් නොගැළපීමක් පවතින බවයි" ඔබ එකග වන්නේද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

ii. සේවා වියුක්තියේ ආර්ථික හා ආර්ථික නොවන පිරිවැය විකාර කරන්න. (ලකුණු 10)

6. i. පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය සිදුවන්නේ කෙසේද? රූප සටහනක් මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 08)

ii. . "ශ්‍රී ලංකාවේ වර්තමානයේ දක්නට ලැබෙන උද්ධමනීය තත්වය හුදු ඉල්ලුමෙන් ඇදුනු හෝ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් නොවේ. එය ආර්ථික ක්‍රමයේ පවතින ව්‍යුහාත්මක ගැටලු පදනම් කරගෙන පැනනැගුනු තත්වයකි" ශ්‍රී ලංකා ආර්ථිකයෙන් සුදුසු උදාහරණ ගෙන ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 12)

7. "කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ පදනම් වර්ෂ, එනම් CCPI 2006/07, 2002 සහ 1952 සලකා බැලීමේදී ශ්‍රී ලාංකිකයින්ගේ වියදම් ගතිපැවතුම් හා භාණ්ඩ පැසෙහි සංයුතිය පිළිබඳ කදිම චිත්‍රයක් ලබාදෙයි". ඉහත සඳහන් පදනම් වර්ෂ තුනහී ශක්තිමත්භාවයන් හා දුරවල්තාවන් දක්වමින් මෙම කියමන විභාග කරන්න. (ලකුණු 20)